# 46

# සිංහල භාෂාවේ හලන්ත භාවිතයේ අවගමනයට බලපෑ හේතු

*කොබ්බෑකඩුව, එච්. ජී. ඒ. වී. කේ. එම්.* [1]

සිංහල ගද්‍ය භාෂාව, නූතන මිශ්‍ර සිංහල ස්වරූපයට පත්වීමේ මූලික අඩිතාලම දමෙන්නේ ක්‍රි. ව. 8 වැනි සියවසේ සිට ක්‍රි. ව. 13 වැනි සියවස දක්වා වූ මධ්‍යතන සිංහල අවධියේ දී ය. 'ඇ' කාරය, අර්ධානුනාසික (සඤ්ඤක), මහප්‍රාණ අක්ෂර, දීර්ඝ ස්වර භාවිතය, ඇතැම් තැනක අක්ෂර මධ්‍යගත 'අ' ස්වරය ගිලිහී යාම, වචනාන්තයේ 'අ' ස්වරය ගිලිහී යාම, එම නිසා හලන්ත ස්වභාවයක් ප්‍රකට වීම, මෙම යුගයේ භාෂා ලක්ෂණ විය. හලන්ත ස්වභාවයේ ප්‍රවණතාව හැර උක්ත සියලු ලක්ෂණ නූතන සිංහල භාෂාවේ තවමත් දැකිය හැකි වුව ද 'හ' කාරය හැර සියලු ම ව්‍යංජනාක්ෂරවල පාදාන්තයේ හලන්ත ස්වරූපය ගැනීමේ ප්‍රවණතාව, මධ්‍යතන සිංහල යුගයේ අවසානයටත් සියවස් දෙකකට පමණ පෙර (ක්‍රි. ව. 10 වන සියවසෙහි අවසානය පමණ වන විට) අභාවයට යාම විශේෂත්වයකි. ප්‍රස්තුත භාෂා යුගය පිළිබඳ සාකච්ඡා කෙරෙන විට, මේ පිළිබඳ ව විවිධ මත පළ වුව ද, ඍජු ව ඒ හා සම්බන්ධ විමර්ශනාත්මක පර්යේෂණයක් සිදු නොවීම ඌනතාවකි. සිංහල භාෂාවේ ශීඝ්‍ර දියුණුවක්, විශාල වෙනසක් හා ශීඝ්‍ර විකාසයක් ප්‍රකට කරන වැදගත් ම අවධියේ මුල් භාගයේ දී ඇරඹී, යුග ප්‍රවණතාවක් ව පැතිරී, යුගාවසානයටත් පෙර භාෂාවෙන් ඉවත් වූ, හලන්ත ශබ්ද ස්වරූපයට එසේ වූයේ මන්දැයි විමසා බැලිය යුතු ය. මේ සඳහා ක්‍රි. ව. 7, 8, 9 සියවස්වල සීගිරි ගී, කාලානුරූපී ව තෝරා ගත් ශිලාලේඛන, තත් කාලීන පොත්පත්, විද්වත් මතිමතාන්තර ක්‍රි. ව. 8 - 10 සියවස් සීමාව තුළ අධ්‍යයනයට ලක් කෙරෙමින්, හලන්ත ස්වරූපයේ අවගමනයට ප්‍රධාන හේතු විමර්ශනය කෙරේ.

ප්‍රමුඛ පදඃ මධ්‍යතන යුගය, හලන්ත, ප්‍රවණතාව, අවගමනය, ස්වරාන්ත

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* kobbekaduweanuradha@gmail.com